**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014**

**2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්**

**සමාජීයවිද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය**

**සන්නිවේදන අධ්‍යයන මූලධර්ම MACO E – 1015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය (03)

---

1. සන්නිවේදන ක්‍රියාවලිය වඩාත් සාර්ථක වන්නේ සන්නිවේදන මූලිකාංග අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධතාව හේතුවෙනි. පැහැදිලි කරන්න. (ලකුණු 20)

2. වාචික සන්නිවේදනය අර්ථවත් කරගැනීමේදී නිර්වාචික සන්නිවේදන විධික්‍රම භාවිතයට ගතහැකි ආකාරය නිදසුන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 20)

3. නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය වඩාත් අර්ථපූර්ණ වීම සඳහා සමාජ වගකීම් සන්නිවේදන සංකල්පය ස්ථාපනය වී තිබිය යුතුය. අදහස් දක්වන්න. (ලකුණු 20)

4. සන්නිවේදන ක්‍රියාවලියේදී ප්‍රතිපෝෂණය (Feedback) සන්නිවේදකයා කෙරෙහි බලපාන ආකාරය සන්නිවේදන ආකෘති ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

5. ජනමතය ගොඩනැංවීමේදී නව මාධ්‍ය සතු ශක්‍යතාව ප්‍රබල වී ඇත. මෑතකාලීන ශ්‍රී ලාංකීය අත්දැකීම් පාදක කරගනිමින් විස්තර කරන්න. (ලකුණු 20)

6. ජනමාධ්‍ය ආයතන මගින් සිදුකරන ආයතනික ප්‍රවර්ධන ක්‍රියාකාරකම් (Station Promotions) හේතුවෙන් ග්‍රාහක පර්යේෂණවල විශ්වසනීයත්වය බිඳවැටී ඇත. මාධ්‍ය පර්යේෂණවල වැදගත්කම පෙන්වා දෙමින් මේ පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

7. "මාධ්‍යයට හසුනොවී මාධ්‍ය හසුකරගැනීම මාධ්‍ය සාක්ෂරතාවයි." මාධ්‍ය සාක්ෂරතාවට අදාල මූලික ලක්ෂණ පිළිබඳ සැලකිලිමත් වෙමින් විස්තර කරන්න. (ලකුණු 20)

8. මාතෘකා 04ට කෙටි සටහන් ලියන්න.

I. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

II. මාධ්‍ය ප්‍රතිපත්ති

III. මාධ්‍ය සංස්කෘතිය

IV. සන්නිවේදන අරමුණු

V. සත්ව සන්නිවේදනය

VI. අධිපතිවාදී සන්නිවේදන සංකල්පය (ලකුණු 05×4 - 20)

***********************